INTRODUCING 1st TIME IN UK

FareDeals Travel & Tours

Fly With Someone You Trust

FareDeals Travel & Tours Ltd.
458, Alexandra Avenue, Rayner's Lane,
(Opp:Tube). HA2 9TL. United Kingdom.

- All Deals Available in Colombo Market (in Rupees)
- Cheaper than Leading Agents in Colombo
- We deliver Tickets to your Door Step in Sri Lanka
- No Middlemen, Book Directly with us in London

**Fly to Colombo**

| | |
|---|---|
| Srilankan Air | £ 380 |
| Qatar Air | £ 290 |
| Kuwait Air | £ 260 |
| Oman Air | £ 190 |
| Ethihad Air | £ 350 |

Buy your COLOMBO to LONDON/ UK, Australia, Italy, USA, Tickets. pay in pounds or rupees.

**Fly to London / UK**

| | |
|---|---|
| Srilankan | Rs. 85000* |
| Qatar | Rs. 62000* |
| Kuwait | Rs. 56000* |
| Royal Jor | Rs. 58000* |

Student Offers (o/way)

| | |
|---|---|
| Srilankan | Rs. 42000 |
| Qatar | Rs. 58000* |
| Kuwait | Rs. 41200* |

* Fares subject to taxes/change

Contact - Dulip, Nimesha, Sunirma or Fernando.

Emergency Travel ctc Dulip 07551549559

0208 150 9183

Call us 0800 612 4045 info@faredealtravels.co.uk

ETIHAD AIRWAYS Emirates CATHAY PACIFIC KUWAIT AIRWAYS SriLankan QATAR AIRWAYS


# Mrs අමෘතලිංගම් ලංකාවට ඇවිත් ‘බොඩිගාඩ්’ හමුවේ

එල්ටීටීඊ කොටි ත්‍රස්තවාදීන් විසින් 1989 ජූලි 11 වෙනි දින කොළඹදී දී ඝාතනය කරන ලද, එවකට විපක්‍ෂ නායකව සිටි ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ ඔඹබත සභාපති අප්පාපිල්ලේ අමෘතලිංගම් මහතාගේ වැන්දඹු බිරිඳ වන මන්ගයක්කරාසි අමෘතලිංගම් මහත්මිය පසුගිය සතියේ වසර 21 කට පසු ශ්‍රී ලංකාවට පැමිණියාය. දැන් 78 වන වියේ පසුවන ඇය සමග වෛද්‍යවරයෙනකු වන ඇගේ පුත්‍රයා ද පැමිණියේය. මෙම ගමනේදී ඔව්හු විශේෂ හිතවතෙකු කෘතඥපූර්වකව බැහැ දකිනු සඳහා කෑගල්ලේ අඹලපිටිය නම් ගමට ගියහ. ඒ හිතවතා නම් මියගිය අමතෘලිංගම් මහතාගේ බොඩිගාඩ් වශයෙන් සේවය කළ කෑගල්ලේ පී. ඒ. නිශ්ශංකය.

ගාමිණී දිසානායක ඇමතිවරයාගේ පුද්ගලික ආරක්‍ෂකයාව සිටි නිශ්ශංක පසුව විපක්‍ෂනායකයාගේ පුද්ගලික ආරක්‍ෂක ලෙස යොදවන ලදුව කොළඹ බුලර්ස් පාරේ තිබූ අමෘතලිංගම් මහතාගේ තාවකාලික නිවසේ සේවයට ගොස් තිබුණි. මෙකියන ලද දවසේ ආයුධ අතැති කොටියන් තිදෙනෙකු දේශපාල නමය සාකච්ඡාවකට ආ අය ලෙස අහවා එහි පැමිණ ඇත. ඇතුළතදී ඔව්හු අමෘතලිංගම් මහතාටද, එතැන සිටි යාපනදිස්ත්‍රික් මන්ත්‍රී යෝගේස්වරන්ටද වෙඩිතැබූහ. එතැන සිටි නිශ්ශංක වහා ක්‍රියාත්මකව තම අත තිබූ රිවෝල්වරයෙන් ඒ කොටි තිදෙනාටම වෙඩි තබා මරාදැමුවේය.

නිශ්ශංක හා ඔහුගේ බිරිඳ කෑගල්ලේ සිය නිවසේදී අමෘතලිංගම් මහත්මිය සහ පුත්‍රයා ඉතා සුහදව පිළිගත් අතර අමෘතලිංගම් මහත්මිය නිශ්ශංක බදා වැළඳ හඬන්නට වූවාය. තම දරුවෙකු මෙන් නිශ්ශංක වටින බවද කීවා ය. එය සතුටත් දුකත් මුසු වූ අවස්ථාවකි. එහිදී නිශ්ශංකගේ නිවසින් දිවා ආහාරය ගත් ඇය ඔවුන්ට මුව නොසෑහෙන සේ ස්තුතිකර නැවත ලබන වසරේත් ශ්‍රී ලංකාවට ආ විට ඔවුන් බලන්නට එන බව ද පැවසුවා ය. දැනට එංගලන්තයේ පදිංචිව සිටින ඇය තම පවුලේ අයට දේශපාලනයට ඒමට අදහසක් නැති බවත් ත්‍රස්තවාදය නැසීම ගැන ශ්‍රීලංකා රජයට ප්‍රශංසාකරන බවත් එහි දී කියා ඇත.

## යාපා පටුනයි දහම් අමාවයි

මෑත ඉතිහාසයේ ප්‍රථමවරට සිංහළ හා ද්‍රවිඩ බසින් වෙසක් භක්ති ගී ගායනයක් මෙවර වෙසක් උත්සවය වෙනුවෙන් යාපනයේ දොරේඅප්පා ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී. එයට යාපනයේ වැසියන් විශාල රාශියක් සහභාගි වූ අතර යාපනයේ ගුරු ශිෂ්‍ය පිරිස් විසින් ඒ භක්ති ගී ගායනා කරන ලදී. එය නම් කර ඇත්තේ **යාපා පටුනයි දහම් අමාවයි** යනුවෙනි. ජාතික සමගිය තහවුරුකිරීමේ අදහසින් සිද්ධ කළ මෙම මහඟු කර්තව්‍ය යාපන ප්‍රදේශයේ ආරක්‍ෂාව භාර නිලධාරි මේජර් ජෙනරාල් මහින්ද හතුරුසිංහ මහතාගේ අදහසක් ක්‍රියාවට නැගීමකි.


MINOLANKA PROUDLY PRESENTS



Roshan Fernando with

FLASHBACK

FIRST TIME IN LONDON UK

SURENDRA AND AMILA

OPEN LIVE STAGE OUT DOOR MUSICAL EXTRAVAGANZA
25th of September at 6.00 pm

HARROW LEISURE CENTRE
Charistchurch Avenue, London HA3 5BD

Shantha - 07817409520 Sudesh - 07737192123 Kumudu - 0791202862 Sanjee - 07595901588

Main Sponsors: MCG, FAST CASH
Co-Sponsor: FareDeals Travel & Tours - Fly With Someone You Trust
Electronic media sponsor: www.sesatha.co.uk
Minolanka


## ♥ පැටියො ඩාලිං



“ පැටියො මොකෝ මේ හරි සංතෝසෙන්....ඒ ? ”

“ සංතෝස නැද්ද පැටියො .....? අන්න අගමැති ඩේවිඩ් කැමරන් ලියුමක් එවලා.... එයාට දිනන්න උදව් කෙරුවට අපට ස්තුති කරලා... ”

“ අපෝ ඕක එච්චර ගණන් ගන්න එපා....... එයා ඔය ලියුම මෙහේ ඉන්න දන්න නොදන්න හැම කොල්ලලන්ටයි..... බල්ලන්ටයි..... කොටින්ටයි..... ඔය ඔක්කෝටම යවපු එකක්......”


## Sinhala Lesson 10 සිංහළ පාඩම

### සිංහල ඉගෙනීමට පහසු මගක් !

පහත දැක්වෙන සිංහල අකුරු ශබ්දකරන්නේ ඊට යටින් ඇති ඉංග්‍රීසි වචනයේ ඉරිගසා ඇති කොටස හඬ නැගෙන විධියට බව දරුවන්ට කියා දෙන්න.

**The sound of each Sinhala letter corresponds to the underlined part of the English word. Now read aloud the Sinhala letter.**

### Vowel Strokes



| | | | | |
|---|---|---|---|---|
| ද | දා | දැ | දෑ | |
| the / thus | Dhas | that | than | |
| දි | දී | දු | දූ | දෙ |
| this | these | Urdu | Dhoopa | then |
| දේ | දො | දෝ | ද් | |
| they | Dodol | though | with | |

♦ ආචාර්‍යා සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

## හරස්පද ප්‍රහේලිකා 119

**හරහට :**
1 සුදුසු 3 අහහරු ග්‍රහයා
5 පිරිසියට වඩා ලොකුය
7 රජතුමා 9 කවි
10 ආසාකරන
11 අනාගතය

**පහළට :**
1 හැමවිටම
2 සඳට තවත් නමකි
4 පිරිමි නමකි
6 කැමති
8 දම්වැල 9 හික්මීමේ ගුණය

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | ■ | 3 | 4 |
| 5 | | 6 | ■ | |
| | ■ | 7 | 8 | |
| ■ | 9 | | | ■ |
| 10 | | ■ | 11 | |

**ගියවර නිවැරදි විසඳුම්**

**හරහට :** 1 විත 3 නදී 5 දුලබ 7 රසය 9 අවාසි 10 මුසු 11 රිදී
**පහලට :** 1 විදුලි 2 නල 4 දීපය 6 බරවා 8 සසිරි 9 අසු

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

### තක්කාලි ව්‍යංජනය
### Tomato Curry

**අවශ්‍ය ද්‍රව්‍ය :** තක්කාලි හෝ ටින් තක්කාලි ග්‍රෑම් 425
එළවළු තෙල් මේස හැඳි 2 ක්
කහ ස්වල්පයක්
මිරිස් කුඩද තේ හැඳි 1½ ක්
තුනපහ මේස හැඳි 1½ ක්
පොඩිකර ගත් සුදුළූණු බික් 3 ක්
අඟලක පමණ තලාගත් ඉඟුරු කැබැල්ලක්
රම්පෙ,කරපිංචා සහ කුරුඳු පොතු කැබැල්ලක්
උළුහාල් මේස හැඳි 1 ක්
උම්බලකඩ සිහින් කැබලි තේ හැඳි 2 ක්
කරදමුංගු හා කරාබු නැටි 3 ක් පමණ
පොල් කිරි කෝප්ප 1 ක්
බොම්බයි ළූණු ගෙඩි 2 ක් සිහින්ව ලියාගත්
මහතට කපාගත් අමු මිරිස් කරල් 3 ක්
ලුණු සහ සීනි ස්වල්පයක්

**සාදන ක්‍රමය :** සාස්පානක් ලිප තබා ඊට තෙල් දමා රත්වන විට ලියාගත් ළූණු දමා රන්වන් පාට වනතුරු බැදගන්න. ළූණු බාගෙට බැදීගෙන එන විට ඊට උළුහාල්, රම්පෙ සහ කරපිංචා, කුරුඳු දමා කළවම්කර බදින්න. මඳ වේලාවකින් එයට සුදුළූණු ඉඟුරු ආදී ඉතිරි සියල්ල දමා බැදෙන්නට හරින්න. සියල්ල බැදීගෙන එන විට කැපූ තක්කාලි සහ උම්බලකඩ දමා දමා කළවම් කරන්න. මඳ වේලාවකින් පොල්කිරි එක්කර හැඳි ගා ඉස්ම මදි නම් උණු වතුරු ටිකක් එක්කරන්න. ගින්දර නිවා ලිප උඩම මඳ වේලාවක් තිබෙන්නට හරින්න.

*මෙම කරිය ඉඳි ආප්ප සහ පොල්මැල්ලුම් සමග කදිමය.*

♦ ප්‍රසාදිනී විජයරත්න Colombo 8 Sri Lanka


Sam's CHICKEN CHICKEN CHICKEN

සෑම්ස් චිකන්

Great Tasting! Great Value!

17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432